මාවනැල්ල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 14 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධි පතිවරයා ගේ වාර්තාව 2014 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ අංක 01 ප්‍රමිතියේ 21(ඉ) වගන්තිය අනුව අදාල ආයතනයේ අනුමත අයවැය දත්ත සමඟ තත්‍ය දත්ත සංසන්දනයන් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැය සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස ඉදිරිපත් කලයුතු වුවත්, එසේ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රමිතියේ 21(ඇ) වගන්තිය අනුව හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ගණනය කිරීමේදී සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි කර තිබූ රු. 4,325,000 ක් වූ වාහන 4 ක් අයිතිය පවරා ගැනීමකින් තොරව සභාවේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිශ්චිතව හඳුනා නොගත් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වූ වියදම් වෙනුවෙන් රු. 2,000,000 ක් ණයහිමියන් යටතේ ගිණුම් ගත කර වර්ෂයේ ආදායමින් ලියා හැර තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල මුද්දර ගාස්තු රැස්කිරීම වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රු. 67,575 ක කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

1.3.3 අසම්භාව්‍ය බැරකම්

සභාවට එරෙහිව හා සභාව විසින් පවරා ඇති නඩු සම්බන්ධ විස්තර ඇතුලත් අසම්භාව්‍ය බැරකම් වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.4 නොසැසඳුන පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 03 කට අදාල ශේෂයන්ගේ එකතුව රු. 94,559,012 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 62,309,184 ක් වූයෙන් වෙනස රු. 32,249,828 ක් විය.

1.3.5 ගෙවිය යුතු ගිණුම් හා ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ණයහිමි ගිණුම් ශේෂ වල වටිනාකම රු. 17,450,094 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු. 602,036 ක් විය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ යොමුව | අනුකූල නොවීම් තීරණ වලට |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මු.රෙ. 570 (ඇ) | 1999 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුල තැන්පත් කරන ලද එකතුව රු. 378,448 ක් වූ තැන්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | සබරගමු පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | |
| | 261.2.2 රීතිය | වර්ෂ 2000 සිට 2011 දක්වා අවස්ථා 4 කදී නිලධාරීන් 4 දෙනෙකු ලබාගත් රු. 90,207 ක තත්කාර්යය අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| | 5.8 වගන්තිය | වටිනාකම රු. 231,786,679 ක් වූ වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් තහවුරු වී නොතිබුණි. |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2012 මැයි 29 දිනැති අංක 3/2012 දරන චක්‍රලේඛය | |
| | කොන්දේසි අංක 06 හා 07 | ඉන්ධන අත්තිකාරම් වශයෙන් ලබාදී තිබූ රු. 1,410,000 ක ඉන්ධන දීමනා ප්‍රාදේශීය සභාවට අදාල රාජකාරි කටයුත්තක් සඳහාම යෙදවූ බවට තහවුරු කර නොතිබූ අතර, අත්තිකාරම් මුදල් පියවීමටද කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | <u>පළාත් පාලන කොමසාරිස්ගේ 2005 ජුනි 01 දිනැති අංක 2005/04 දරන චක්‍රලේඛය</u><br>103 කට අදාල ඉඩම් 27 ක් සඳහා<br><br>බිම් ප්‍රමාණයක්ද සභාවට අහිමි වී | වර්ෂ 1999 සිට 2013 දක්වා අවස්ථා 27 කදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබූ ඉඩම් අක්කර සභාවේ ආදායම් පරිපාලකවරයාගේ තාවකාලික තක්සේරුව මත ලබාගතයුතු 1% ක අත්තිකාරම් ලබා ගෙන නොතිබූ අතර, ගිවිසුම්වලට නොඑළඹීම මත විකුණනු ලැබූ ඉඩම් වලින් 10% ක තිබුණි. |

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 23,881,817 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,169,593 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 14,712,224 ක වර්ධනයක් පෙන්වීය.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වෙනත් අයභාර ආදායම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| <u>ආදායම් ප්‍රභවය</u> | <u>ඇස්තමේන්තුගත</u> | <u>තථ්‍ය</u> | <u>දෙසැම්බර්31දිනට සමුච්චිත හිඟය</u> |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 12,945 | 13,075 | 15,713 |
| (ii) බදු කුලී | 21,057 | 18,228 | 1,851 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,610 | 1,124 | 153 |
| (iv) වෙනත් ආදායම් | 67,216 | 55,642 | 49,506 |

2.3.2 <u>දැන්වීම් පුවරු ගාස්තු</u>

2013 වර්ෂයේදී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සවිකර තිබෙන දැන්වීම් පුවරු අතුරින් හිමිකරුවන් විසින් දැනුම් දුන් දැන්වීම් පුවරු වලින් පමණක් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර තිබුණි. ආදායම් පරිපාලකවරුන් දැනුවත් කර සමීක්ෂණයක් මඟින් දැන්වීම් පුවරු පිළිබඳ තොරතුරු රැස් කිරීමට පියවර ගෙන නොතිබුණි.

2012 වර්ෂයේදී දැන්වීම් පුවරු ගාස්තු ලෙස අයකර ගතයුතුව තිබූ රු. 243,043 ක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු වටිනාකම රු. 42,631,106 ක් විය.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා 2008 වර්ෂයේදී කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලේ කාමර වෙන් කිරීම වෙනුවෙන් රු. 116,400 ක වියදමක් දරා තිබූ අතර, බදු ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව සභාව විසින් සවි කර ඇති සියළුම උපාංග සභාව සතු වන බවත්, ගොඩනැගිල්ල ආපසු භාර දීමේදී එම සවි කිරීම් ඉවත් කරගනු ලබන බවත්, සඳහන්ව තිබුණද, ගොඩනැගිල්ල ආපසු භාරදී වසර කිහිපයක් ගතවී තිබුණද, එම භාණ්ඩ ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට එරෙහිව හා සභාව පැමිණිලිකරුවී පැවරුණු නඩු කටයුතු වලදී සභාව වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීමට පත් කරන ලද නිලධාරීන් එම නඩු විමසීම් අවස්ථා වලට සහභාගී වීමට රාජකාරි නිවාඩු ලබා ගෙන නඩු වාර සඳහා සහභාගි නොවීම හේතුවෙන් සභාවට අවාසිදායක නඩු තීන්දු ලැබී තිබුණි. රාජකාරි පැහැර හැරි නිලධාරීන් සම්බන්ධව විනය පරීක්ෂණ සිදු කිරීමටත්, නඩු කටයුතු වලදී අනෙක් පාර්ශවය සඳහා ගෙවීමට සිදු වූ සහනයන් සහ නීතීඥවරුන් සඳහා ගෙවීමට සිදු වූ ගාස්තු ගණනය කර රාජකාරි පැහැර හැරි නිලධාරීන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

තීන්දුව ප්‍රකාශයට පත් කල නඩු ලිපිගොනු 27 ක් විගණනයට ඉදිරිපත් කලද, සියළුම තොරතුරු ඇතුලත් කරමින් යාවත්කාලීන කරන ලද නඩු ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී අනවසර ඉදි කිරීම් සම්බන්ධ පැමිණිලි 21 ක් ලැබී තිබුණද, එයින් 16 ක් සම්බන්ධව කාර්මික නිලධාරීන් සභාවට වාර්තා කර නොතිබුණි.

(ඈ) රජයේ නිවාඩු දින සහ සති අන්ත දිනයන්හි රාජකාරි සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, නිවාඩු දිනට පසුව අනුමැතිය ලබාදී තිබුණි.

(ඉ) මාවනැල්ල වාහන නැවතුම්පල සඳහා පවරා ගනු ලැබූ ඉඩම වෙනුවෙන් වන්දි මුදල් ගෙවීම ප්‍රමාද කිරීම මත රු. 300,339 ක පොලී මුදලක් ගෙවීම හා වාහන 13 ක වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගැනීමේදී ප්‍රමාද දඩ ලෙස රු. 11,843 ක මුදලක් ගෙවීම සම්බන්ධයෙන් එයට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සභා සේවකයින් 10 දෙනෙකු 2007 වර්ෂයේ සිට 2011 අවසානයට ලබා ගත් වැටුප් රහිත නිවාඩු දින 733 ½ ක් නිවාඩු ලේඛණයේ සටහන් කර තිබුණද, එම දිනයන් සඳහා අය කර නොතිබුණි.

(උ) 2012 වර්ෂයේදී සෞඛ්‍ය කම්කරුවන් 04 දෙනෙකුගේ වැටුප් රහිත නිවාඩු දින 88 ක් සඳහා ඒකාබද්ධ වැටුපෙන් පමණක් අය කිරීම හේතුවෙන් ප්‍රාදේශීය සභා අරමුදලට රු. 35,705 ක අලාභයක් සිදුවී තිබුණි.

3.2 <u>ඌන උපයෝජිත වත්කම්</u>

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අක්‍රීයව පැවති බැංකු ගිණුම්වල අගය රු. 15,694 ක් විය.

04. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ අයවැය ලේඛණයේ වැඩ සටහන් 06 කට අදාල වැය විෂයයන් 130 ක් සඳහා වෙන් කර තිබූ රු. 111,837,181 ක ප්‍රතිපාදන අතුරෙන් අවස්ථා 79 කට අදාල රු. 97,587,181 ක් වූ ප්‍රතිපාදන මුදල් 100% ක් ද, අවස්ථා 51 කට අදාල ප්‍රතිපාදන වලින් 50% ත් 99% ත් අතර වූ රු. 11,400,680 ක මුදලක්ද, වශයෙන් එකතුව රු. 108,987,861 ක් උපයෝජනය කර ගෙන නොතිබුණි.

4.2 <u>පිළිතුරු නොදුන් විගණන විමසුම්</u>

2013 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 07 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණුදෙනු වල ගණනය කල හැකි වටිනාකම රු. 1,763,019 ක් විය.

4.3 <u>අභ්‍යන්තර විගණනය</u>

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙන යාම සභාපතිවරයාගේ කාර්යභාරයක් වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) අයවැය පාලනය

(ii) ආදායම් පරිපාලනය

(iii) ණයහිමි පාලනය